# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**

**2012 ජනවාරි / පෙබරවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

**ක්‍රිස්තියානි සංස්කෘතිය - CHCU- E2025**

**ක්‍රිස්තියානි කලාව හා සාහිත්‍යය**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) ඇතුලත් වනසේ ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** | **කාලය : පැය 03 යි**

---

### <u>1 වන කොටස</u>

01. මධ්‍යතන යුගයේ ක්‍රිස්තියානි දේවස්ථාන කෙරෙහි බයිසන්තියානු ගෘහනිර්මාණ ශෛලිය කෙතෙක්දුරට බලපා ඇද්ද? විවේචනාත්මකව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

02. ග්‍රීක ඕතඩොක්ස සභාවේ අයිකොන් Icon චිත්‍ර පිළිබඳ විස්තරයක් කරන්න.

03. බැරොක් කලාවේ විශේෂ ලක්ෂණ හා එහි ව්‍යාප්තිය ගැන හැඳින්වීමක් කරන්න.

04. දේවස්ථාන සැරසිලි සහ චිත්‍ර කලාව සම්බන්ධයෙන් නූතන ශ්‍රී ලාංකේය කිතුණුවෝ ගෙන ඇති පියවර කවරේද? නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

05. පහත සඳහන් මාතෘකාවලින් ඔබ කැමති **දෙකක්** විස්තර කරන්න.

    අ) කැටකෝම්බ්ස් චිත්‍ර කලාව
    ආ) ක්‍රිස්තියානි දේවස්ථාන ගෘහනිර්මාණ ශිල්පයේ ආරම්භය
    ඇ) මහනුවර ත්‍රිත්ව විද්‍යාලයීය දේවස්ථානයේ චිත්‍ර කලාව
    ඈ) ගොතික් ආසන දෙව්මැඳුරක දක්නට ඇති ව්‍යුහමය විශේෂතා
    ඉ) පුනරුද යුගයේ ක්‍රිස්තියානි චිත්‍ර කලාවේ සිදුවූ නව පෙරළිය

### <u>2 වන කොටස</u>

06. ජෝන් බනියන් ගේ "මහමූකලාන මැදින්" The Pilgrim's Progress නම් කථාවේ දක්නට ලැබෙන පියුරිටන් සම්ප්‍රදායික ලක්ෂණ නිදසුන් සහිතව විස්තර කරන්න.

07. මැගීවරු (රජතුන් කට්ටුව) අළුත් උපතක් අත්දුටු ආකාරය ටී. එස්. එලියට් ගේ "මැගීවරුන්ගේ ගමන" Journey of the Magi නම් කවි පංතිය ඇසුරෙන් විග්‍රහ කරන්න.

08. ''සුරලොවේ දඩ සුනඛයාණෝ The Hound of Heaven නැමති කවි පංතිය කෙරෙහි ප්‍රැන්සිස් තොම්සන්ගේ ජීවිත අත්දැකීම් පසුබිම් වී ඇත.'' මෙම කියමන ගැන ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

09. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමාගේ ''වේද කාව්‍ය'' නම් කෘතියේ සඳහන් වන සුගති උද්‍යානය මැවීමේ කවි පංතිවල ඇති දේශීය ලක්ෂණ විග්‍රහ කරන්න.

10. ''මළා වූ අය සමාදානයේ සැතපේවා'' යන අදහස තෝමස් ග්‍රේ විසින් රචිත ගම්බද දෙව්මැදුරු සොහොන් බිමක ලියැවුන ශෝකාන්තය නැමති කවි පංතියෙන් විස්තර වන ආකාරය පැහැදිළි කරන්න.

******************************